4287

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2014
# Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ........................................ විභාග අංකය :- ....................

## I - කොටස

සැලකිය යුතුයි:

- I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 01 - 20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) උඩරට රාජ්‍යය බිහිවීම කෝට්ටේ රාජ්‍යයට විශාල අභියෝගයක් වූ නිසා කෝට්ටේ පාලකයන් හැම විටම උත්සාහ ගනු ලැබුවේ,
(1) උඩරට පාලකයා මිත්‍ර කර ගැනීමටයි.
(2) පෘතුගීසීන් සමඟ සබඳතා පවත්වා ගැනීමයි.
(3) උඩරට ප්‍රදේශ තම අණසකට යටත් කර ගැනීමයි.
(4) උඩරට සමඟ විවාහ සබඳතා ඇති කර ගැනීමටයි.

(02) පෘතුගීසීන් සමඟ සටන් කර උඩරට බලය ලබාගත් පළමුවන විමලධර්මසූරිය රජු රාජ්‍යත්වය තහවුරු කර ගැනීමට ගන්නා ලද ක්‍රියාමාර්ගය කුමක් ද?
(1) කුසුමාසන දේවිය අගබිසව කරගැනීම
(2) දළදා වහන්සේ තැන්පත් කිරීමට මාළිගාවක් සෑදීම
(3) උඩරටියන් සමඟ මිත්‍ර සබඳතා පැවැත්වීම
(4) කෝට්ටේ සමඟ මිත්‍ර සබඳතා පැවැත්වීම

(03) සම්ප්‍රදායික ගති ලක්ෂණ රාශියකින් සමන්විත වූ උඩරට සමාජය තුළ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණයක් සඳහන් පිළිතුර කුමක් ද?
(1) පාරම්පරික ඉඩම් භුක්තිය පැවතීම
(2) ගුණගරුක බව හා අන්‍යෝන්‍ය සහයෝගය පැවතීම
(3) කුලවලට විශේෂිත වූ නිෂ්පාදන කටයුතු කිරීම
(4) අධ්‍යාපනික ප්‍රබෝධයක් පැවතීම

(04) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනික හා ශාසනික කටයුතුවල දියුණුව රඳා පැවතියේ රාජ්‍ය අනුග්‍රහය මතය. ආගමික පුනර්ජීවනය හා බෞද්ධ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් විශිෂ්ට සේවයක් කළ උඩරට රජතුමා කවුරුන් ද?
(1) රාජාධි රාජසිංහ
(2) ශ්‍රී විජය රාජසිංහ
(3) ශ්‍රී වික්‍රම රාජසිංහ
(4) කීර්ති ශ්‍රී රාජසිංහ



164

(05) චන්ද්‍රයා මතුපිට ආවාට ඇතිබව
සූර්යයාගේ ලප ඇති බව
සෙනසුරු ග්‍රහයා වටේ වළලු කීපයක් ඇති බව
ඉහත තොරතුරු ලෝකයට අනාවරණය කරන ලද විද්‍යාඥයා වන්නේ,
(1) ජොහැන්නස් කෙප්ලර් ය. (2) ගැලීලියෝ ගැලීලි ය.
(3) අයිසෙක් නිව්ටන් ය. (4) නිකලස් කොපර්නිකස් ය.

(06) පහතින් දක්වා ඇත්තේ දේශ ගවේෂණ ව්‍යාපාරයට සම්බන්ධ පුද්ගලයින් හා ඔවුන් සොයාගත් රටවල් ය. ඒවායින් සාවද්‍ය තොරතුරු දැක්වෙන්නේ කුමන පිළිතුරෙන් ද?
(1) මැගලන් - පිලිපීනය (2) කොලොම්බස් - හිස්පැනියෝලාව
(3) ප්‍රැන්සිස්කෝ පිසාරෝ - දකුණු අප්‍රිකාව (4) ෆර්නැන්ඩෝ කෝටීස් - මෙක්සිකෝව

(07) යුරෝපා පුනරුදය ආරම්භ කරමින් වේගවත් ශාස්ත්‍රීය දියුණුවක් ප්‍රථමයෙන් ම ඇති වූ රට කුමක් ද?
(1) ඉතාලිය (2) ප්‍රංශය (3) එංගලන්තය (4) නෙදර්ලන්තය

(08) පුනරුද සමයේ කලා ක්ෂේත්‍රයේ ඇති වූ ප්‍රබෝධයත් සමඟ කලා නිර්මාණවල දී දකිය හැකි වූ විශේෂ ලක්ෂණයක් වූයේ,
(1) ආගමික චින්තනය පදනම් කරගෙන නිර්මාණ බිහි වීමයි.
(2) පල්ලියේ පූර්ණ අධීක්ෂණය යටතේ නිර්මාණ බිහි වීමයි.
(3) නිදහස් ස්වාධීන නිර්මාණ ඉදිරිපත් නොවීමයි.
(4) රස වින්දනයට මුල්තැන දීමයි.

(09) A අලගියරි ඩාන්ටේ
B ප්‍රැන්සිස් පෙට්රාක්
C නිකොලායි මැකියාවෙලි
පුනරුද සමයේ ශාස්ත්‍රීය කටයුතුවල නිරත වූ ගත් කතුවරු කිහිපදෙනෙකු ඉහත දැක්වේ. ඔවුන් රචනා කරන ලද කෘතීන් අනුපිළිවෙලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.
(1) ලෝරාට සැහැලි කවි, කුමාරයා, ඩී කැමරන්
(2) කුමාරයා, ඩිවිනා කොමඩියා, ලෝරාට සැහැලි කවි
(3) ඩිවිනා කොමඩියා, ලෝරාට සැහැලි කවි, කුමාරයා
(4) ඩිවිනා කොමඩියා, යුටෝපියා, ලෝරාට සැහැලි කවි

(10) කෝට්ටේ පාලකයා වූ හත්වන බුවනෙකබාහු රජතුමාට පෘතුගීසීන්ගෙන් පිළිසරණ පැතීමට සිදුවූයේ කුමන හේතුවක් නිසා ද?
(1) ධර්මපාල කුමරුගේ පිළිරුවක් තනා පෘතුගාලයට යැවීමට
(2) මුස්ලිම්වරු කෝට්ටේ රාජධානියෙන් පන්නා දැමීමට
(3) විජයබා කොල්ලයට උදව් ලබා ගැනීමට
(4) මායාදුන්නේ රජුගෙන් ආරක්ෂා වීමට

(11) සීතාවක රණශූර පාලකයෙකු වූ පළමුවන රාජසිංහ රජතුමා මරණයට පත්වන්නේ,
(1) පෘතුගීසීන්ගේ වෙඩි පහරකිනි. (2) උණකටුවක් ඇනී විෂ වීමෙනි.
(3) කොනප්පු බණ්ඩාර සමඟ සටන් කිරීමෙනි. (4) මුස්ලිම්වරුන්ගේ කුමන්ත්‍රණයකිනි.

(12) පෘතුගීසීන්ට කප්පම් ලෙස වසරකට ඇතුන් දෙදෙනෙකු ලබා දීමට පොරොන්දු වී ක්‍රි.ව. 1617 දී පෘතුගීසීන් සමඟ ගිවිසුමක් ඇති කරගත් රජතුමා කවුරුන් ද?

(1) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා (2) හයවන විජයබාහු රජතුමා
(3) සෙනරත් රජතුමා (4) හත්වන බුවනෙකබාහු රජතුමා

(13) ක්‍රි.ව. 1602 දී උඩරට රජු බැහැදැකීමට පැමිණි පළමු ලන්දේසි ජාතිකයා කවුරුන් ද?

(1) සී. බෝල්ඩ් ද වාර්ට් (2) ජොරිස් ෆන් ස්පිල්බර්ජන්
(3) වෙස්ටර් වෝල්ඩ් (4) ලෝරන්ස් ගිල්

(14) මහනුවර රාජධානි සමයේ 'කඩවත්' නමින් හඳුන්වන ලද්දේ,

(1) උඩරට රාජ්‍යයට ඇතුළු වීමට තිබූ ස්ථානයි.
(2) රටේ කැරලි කෝලාහල ඇති වූ ස්ථානයි.
(3) ලන්දේසීන්ගේ බලකොටු පිහිටි ස්ථානයයි.
(4) විදේශ වෙළඳාම කළ නැව්තොටු පිහිටි ස්ථානයි.

(15) ලන්දේසීන් හා උඩරට රජවරු අතර මිත්‍රශීලී සබඳතා පැවති බවට දිය හැකි උදාහරණයක් වන්නේ

(1) උඩරට ප්‍රදේශයෙන් වෙළඳ ද්‍රව්‍ය ලබාගැනීමයි.
(2) ලංකාවට උසාවි ක්‍රමයක් හඳුන්වා දීමයි.
(3) තායිලන්තයෙන් උපසම්පදාව ගෙන ඒමට නැව් ලබාදීමයි.
(4) මාතර තාරකා බලකොටුව ඉදිරිකිරීමයි.

(16) කාර්මික විප්ලව සමයේ නිපැයුම් කීපයක් 'අ' තීරුවේ ද, ඒවා නිෂ්පාදනය කරන ලද පුද්ගලයෝ 'ආ' තීරුවේ ද දැක්වේ. එම තීරුදෙක නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.

| 'අ' තීරුව | | 'ආ' තීරුව |
|---|---|---|
| 1. දුවන නඩාව | A | හම්ෆ්‍රි ඩේවි |
| 2. වාෂ්ප එංජිම | B | ඩෙම්ලර් |
| 3. ආරක්ෂක ලාම්පුව | C | ජෝන් කේ |
| 4. මෝටර් රථය | D | ජේම්ස් වොට් |

(1) CDAB (2) CADB (3) BADC (4) DABC

(17) සාමාන්‍ය ජනතාව කුසගින්නේ පාන් ඉල්ලා උද්ඝෝෂණය කරන විට 'පාන් නැතිනම් කේක් කාපල්ලා' යැයි කරන ලද ප්‍රකාශය සම්බන්ධ වන්නේ කුමන විප්ලවයකට ද?

(1) ඉංග්‍රීසි විප්ලවයට (2) ප්‍රංශ විප්ලවයට
(3) ඇමරිකානු නිදහස් සටනට (4) රුසියන් විප්ලවයට

- **18-20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට දී ඇති සිතියම උපයෝගි කරගන්න.**

(18) ක්‍රි.ව. 1453 තුර්කීන් විසින් යටත් කරගත් කොන්ස්තන්තිනෝපලය දක්වා ඇත්තේ කුමන අක්ෂරයෙන් ද?

(1) A (2) B (3) C (4) D

The National e-learning Portal for General Education

(19) පෘතුගීසින්ගේ මව්රට වන පෘතුගාලය දක්වෙන අක්ෂරය කුමක් ද?

(1) D (2) E (3) F (4) N

(20) කාර්මික විප්ලවයේ ආරම්භය සිදු වූ බ්‍රිතාන්‍යය පෙන්වන්නේ කුමන අක්ෂරයෙන් ද?

(1) N (2) O (3) A (4) M




## II කොටස

- පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

(01) තුන්වන වාරය අවසානයේ දී ඉතිහාසය විෂය සඳහා ඔබේ පන්ති කාමරයේ කරන ලද ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) ප්‍රශ්න සැකසීම සඳහා ඔබේ කණ්ඩායමට ලැබුණු මාතෘකාව සඳහන් කරන්න. (ලකුණු 02)

(2) ඔබේ කණ්ඩායම සැකසූ ප්‍රශ්න දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04)

(3) මෙම ක්‍රියාකාරකමේ දී ඔබට ගුරු භවතාගෙන් ලැබුණු උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 04)

(4) ඔබේ කණ්ඩායම තොරතුරු ලබා ගැනීමට භාවිත කළ මූලාශ්‍ර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(5) කණ්ඩායම් ක්‍රියාකාරකම තුළින් ඔබට ලැබුන ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 04)

(02) (1) උඩරට රාජධානිය හැඳින්වීමට භාවිතා කළ නම් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(2) පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| වර්ෂය | සටන සිදු වූ ප්‍රදේශය | පෘතුගීසි නායකයා |
|---|---|---|
| 1630 | A ............................ | B ............................ |
| 1638 | C ............................ | D ............................ |

(ලකුණු 04)

(3) පළමුවන විමලධර්මසූරිය රජුගේ ශාසනික සේවාවන් දෙකක් සඳහන් කොට ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(03) (1) බද්දේ කාර්යාංශයට අයත් වූ පහත සඳහන් දෙපාර්තමේන්තු හැඳින්වීමට භාවිතා කළ නම් ලියන්න.

a අලි ඇතුන්ගෙන් බදු අය කළ දෙපාර්තමේන්තුව

b කුඹල්කරුවන්ගෙන් බදු අය කළ දෙපාර්තමේන්තුව (ලකුණු 02)

(2) විහාර දේපොළ කාර්යාංශයට පැවරී තිබූ කාර්යයන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(3) උඩරට රාජධානියේ පැවති ආර්ථික කටයුතු පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුනු 05)

(04) (1) පුනරුද සමයේ ශ්‍රේෂ්ඨ විද්‍යාඥයින් දෙදෙනෙකු පහත A හා B පින්තූරවලින් දක්වේ. ඔවුන් හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 02)

A

B


(2) පහත සඳහන් කලා ශිල්ප බිහිකළ නිර්මාණකරුවන්ගේ නම් අනුපිළිවෙලින් ලියා දක්වන්න.

C මොනාලිසා චිත්‍රය

D පීටා ප්‍රතිමාව

E ඇතැන්ස් හි පාසල චිත්‍රය

F ශාන්ත ජෝර්ජ් ප්‍රතිමාව (ලකුණු 04)

(3) දේශ ගවේෂණ ව්‍යාපාරය ආරම්භ වීමට බලපෑ හේතු දෙකක් සඳහන් කර ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(05) (1) ක්‍රි.ව. 1505 පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට කෝට්ටේ රාජධානියට අයත්ව පැවති ප්‍රදේශ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) සීතාවක රාජධානියේ බලය වර්ධනය වීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(3) ලංකාවේ කතෝලික ආගම ව්‍යාප්ත කිරීම සඳහා පෘතුගීසීන් අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(06) (1) ලන්දේසි පාලනය සම්බන්ධ පහත සඳහන් තොරතුරු සපයන්න.

A ලංකාවේ පාසල් පාලනය සඳහා ඇති කළ කොමිසම

B ලන්දේසි පූජකවරු හැඳින් වූ නම (ලකුණු 02)

(2) දෙවෙනි රාජසිංහ රජු හා ලන්දේසින් අතර 1638 ඇති වූ ගිවිසුමේ කොන්දේසි දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04)

(3) ලන්දේසි පාලනයේ ප්‍රතිඵල වශයෙන් ලංකාවේ ඇති වූ සමාජ සංස්කෘතික බලපෑම් දෙකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

(07) (1) පහත A සහ B වලින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

A පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය ලොවට දායාද කළ රට කුමක් ද?

B ඇමරිකා එක්සත් ජනපදයේ පළමුවන ජනාධිපතිවරයා කවුරුන් ද? (ලකුණු 02)

(2) යුරෝපා ජාතීන් ඇමරිකාවේ බිහිකළ ජනපද හතරක් නම් කරන්න. (ලකුණු 04)

(3) ප්‍රංශ විප්ලවයට බලපෑ හේතු දෙකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)